<u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන.
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 07 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී සිදු කරන ලද තායිලන්ත විදේශ සංචාරය සඳහා සහභාගී වූ සභිකයින් 06 දෙනෙකු වෙනුවෙන් ගෙවන ලද අනියම් දීමනා රු. 230,382 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් බදු දුන් වට්ටම් රු. 100,847 ක් වැය ශීර්ෂ හරහා වර්ෂයේ වියදමට ගලපනවා වෙනුවට ජ'නල් සටහන් මඟින් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද රු. 8,380,000 ක් වටිනාකමැති වත්කම් පරිත්‍යාග සංචිත වශයෙන් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම මඟින් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලයට අදාල උසාවි දඩ හිඟ ආදායම් ලෙස රු. 677,333 ක් හඳුනාගෙන ඇති අතර, රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව කිසිඳු ආදායමක් හඳුනාගෙන නොතිබුණි. තවද, රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයේ 2013 වර්ෂයට අදාල රු. 57,583 ක් වැනි ඉතා අඩු වටිනාකමක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව උසාවි දඩ බිල්කල ආදායම රු. 2,500,000 ක් වැඩිපුර බිල් කිරීමක් කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 07 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 53,290,327 ක් විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ----------------------------------------- | ------------------ |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132(ඔ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව වර්ෂය තුලදී ආගමික ස්ථාන වල සංවර්ධන කටයුතු සඳහා අවස්ථා 03 කට අදාලව රු. 61,250 ක වියදම් සහා අරමුදලින් දරා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2009 දෙසැම්බර් 22 දිනැති අංක ප.පා.කො.1/2009 (සංශෝධන) දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | පළාත් පාලන ආයතන බල ප්‍රදේශයෙන් පිටත රාජකාරී ගමන් බිමන් සඳහා පමණක් එනම්, පරිපාලන කටයුතු වලට කෙලින්ම සම්බන්ධ රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා සංයුක්ත දීමනා ලබා ගතහැකි වුවත්, තම රාජකාරිය හෝ රාජකාරිය සඳහා වන අනුමැතිය පිළිබඳ කිසිඳු සඳහනකින් හෝ තහවුරු කිරීමකින් තොරව 2014 වර්ෂයේ සංයුක්ත දීමනා වශයෙන් සභාපතිවරයාට රු. 89,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 371(2) | 2013 වර්ෂයේ සිට 2015 ජූනි 22 දින දක්වා ලබා දී තිබූ රු. 4,125,028 ක අත්තිකාරම් මුදලක් නැවත පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි අංක 571 | වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු නියාදනය කල යුතු වුවත්, 2012 වර්ෂය දක්වා ලබාගෙන තිබූ වටිනාකම රු. 2,127,645 ක්වූ තැන්පතු 231 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,742,653 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,077,172ක් විය.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 4,665,480 කින් වැඩිවී තිබූ අතර, එය සියයට 224 ක වැඩිවීමක් විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම් වල අඩුවීමයි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 4,431 | 6,779 | 8,307 |
| බදු කුලී | 1,350 | 1,381 | 1,663 |
| බලපත්‍ර ගාස්තු | 1,352 | 1,593 | 84 |
| වෙනත් ආදායම් | 12,463 | 15,412 | 7,021 |

### 2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු, සේවා සඳහා ගාස්තු සහ වරෙන්තු හා දඩ වලට අදාල ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 10, සියයට 11, හා සියයට 53 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2014 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු එක් ඒකකයකට රු. 3,000 ට වැඩි හිඟ වරිපනම් බදු වල මුළු එකතුව රු. 1,052,953 ක් විය. හිඟ වරිපනම් බදු අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. දේපල හුවමාරුවෙන් පසුව අයිතිකරුගේ නම් වෙනස්වීමේ ක්‍රියාවලියේ පවතින අධික ප්‍රමාදය විශාල වරිපනම් බදු ප්‍රමාණයක් හිඟව පැවතීමට මූලික හේතුවක් විය.

2.3.4 අක්කර බදු

----------------

2015 ජූනි 22 දින වනවිට අයකර ගැනීමට තිබූ හිඟ අක්කර බදු රු. 62,591 ක් විය.

2.3.5 බදු කුලී

-------------------

සභාව සතු කඩකාමර වලින් වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම ආදායම ප්‍රමාද වී පවතින හිඟ කඩකාමර කුලිය රු. 297,368 ක් විය.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල සීමාවට අදාලව උසාවි දඩ අයකර ගැනීම සඳහා අදාල උපලේඛණ ද සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාල සීමාවට අදාලව මුද්දර ගාස්තු උපලේඛණ ගෙන්වා ගෙන නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්නපුර දිසා අධිකරණයේ විභාග වූ ඉඩම් නඩුවට අදාලව ප්‍රකාශිත අධිකරණ තීන්දුවට අනුව විත්තිකාර පාර්ශවය ලෙස සභාව නියමිත පරිදි අධිකරණයට වාර්තා නොකිරීම හා කරුණු දැක්වීමට අපොහොසත් වීම මත විමසීමේ ගාස්තු ලෙස රු. 10,000 ක් ගෙවීමට නියම කර තිබුණි. අධිකරණ කර්තව්‍ය සම්බන්ධයෙන් සභාව නිසි සැලකිල්ලක් නොදැක්වීම හේතුකොටගෙන මෙම විමසීමේ ගාස්තු ගෙවීමට සිදුව ඇති බවද, ඒ පිළිබඳව වගකිවයුතු තැනැත්තන් මඟින් එම මුදල් අයකර ගැනීම හෝ ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් හා සේවකයින් 22 දෙනෙක් වෙතින් අයවීමට තිබූ රු. 159,171 ක ණය ශේෂයක් වර්ෂ ගණනාවක සිට අයකර ගැනීමට නොහැකිව පැවතුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 22 දින පවත්වන ලද අයවැය මහ සභා රැස්වීමේදී කාර්යය මණ්ඩල හා සභිකයින් සඳහා සංග්‍රහ වියදම් ලෙස රු. 75,000 ක වියදම් දරා තිබුණි.

(ආ) විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/01 දරන චක්‍රලේඛ විධිවිධාන අනුව ග්‍රාමීය ප්‍රදේශයන්හි "A" ශ්‍රේණියේ මාර්ග වල ව්‍යාපාරික ප්‍රදේශ තුල විදුලි කණුවක උපරිමය වොට් 110 අධිපීඩන සෝඩියම් වේපර් ලාම්පු යෙදිය හැකි වුවත්, වොට් 250 ක්‍රෝබා වීථි පහන් කට්ටල 05 ක් රු. 47,500 කට මිලදී ගෙන ස්ථාන 05 ක සවිකර තිබුණි.

3.3 විදේශ ගමන් වියදම්

-------------------------

සන අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය පිළිබඳ අධ්‍යයනය සහ පුරුදු නිරීක්ෂණය සඳහා 2014 නොවැම්බර් 02 සිට 07 දින දක්වා මැලේසියාවේදී පැවති පුහුණු වැඩමුළුවක් සඳහා සභාපතිවරයා සහ සභිකයින් 05 දෙනෙකු නිශ්චිත කැඳවීම් ලිපියක් ලැබීමෙන් තොරව පෞද්ගලික ආයතනයක් මඟින් ලද විද්‍යුත් තැපැල් ලිපියක් මත රු. 130,000 බැගින් රු. 780,000 ක් සභා අරමුදලින් වැය දරා සහභාගී වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. විදේශ ගතවීමට පෙර අදාල නිවාඩු ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර නොතිබුණි.

ii. සංචාරය සඳහා වූ වියදම් වලින් කොටසක් පමණක් සභා අරමුදලින් දැරීමට ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී තිබූ නමුත්, සංචාරය සඳහා වන සම්පූර්ණ මුදලම සභා අරමුදලින් වැයකර තිබුණි.

iii. "පළාත් පාලන ප්‍රධානියෙකු, නියෝජිතයෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශීය රජය හෝ විදේශීය ආයතනය හෝ ඒ සඳහා වැය වන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු බව" දක්වා ඇති පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2010 සැප්තැම්බර් 09 දිනැතිව නිකුත් කරන ලද චක්‍රලේඛය පිළිබඳව නොසලකා කටයුතු කර තිබුණි.

iv. පුහුණුව මඟින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාසයක් ඇතුලත ලබාදිය යුතු වුවත්, එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

සභාව වෙත ලැබී ඇති සිංගල් ඩ්‍රම් වෛබ්‍රේටින් යන්ත්‍රය හා ටිපර් රථය සභාවේ අවශ්‍යතාවයන්ට නොගැලපීම හා ප්‍රාදේශීය සභා මාර්ගයෙහි ධාවනය කිරීමට තරම් නොහැකි වීම මත ප්‍රමාණවත් උපයෝජනයකින් තොරව සභා භූමියේ රඳවා තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා අරමුදල් උපයෝගී කරගෙන රු. 300,000 ක් ඇස්තමේන්තුවක් මත ගිවිසුම් වලට එළඹ තිබූ නීලගම පාර සංවර්ධනය කිරීමේ කර්මාන්තය ලෙස සඳහන් කර තිබූ සීමාවන්ගෙන් බැහැරව මාර්ගයේ රබර් වතු යායේ ජලය බැසයන කාණුවක් මත කොන්ක්‍රීට් කණු ඉදිකර ඒ මත පාලමක් ආකාරයෙන් මෙම මාර්ගය ඉදිකිරීම සිදුකර තිබුණි. 2015 ජූනි 23 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මාර්ගයේ අයිතිය සභාවට පවරා ගැනීමක් සිදුකර නොතිබුණි.

(ii) සම්පූර්ණ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකසා නොතිබූ අතර, අඩි 44 ක් දිගින් යුත් කොටසක් පමණක් ඇස්තමේන්තු සකසා ඉදිකර තිබූ අතර, ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු. 60,000 ක් ගෙවා තිබුණි.

(iii) ස්වභාවික ජල මාර්ගයක් මතින් මෙම මාර්ගය ඉදිකිරීම මඟින් එකී ස්වභාවික ජල මාර්ගයේ ස්වභාවික බැස්මට ඇතිවන බාධාව හෝ මෙම ඉදිකිරීම අඩක් නිම කිරීම තුල අත්වියහැකි අනර්ථකාරී බලපෑම අදාල පාර්ශව විසින් කල්තබා හඳුනාගත් බවට කිසිඳු සාක්ෂියක් නිරීක්ෂණය නොවීය.

(ආ) <u>නාරාංගොඩ නිදන්ගල බෝධි විහරය අසලින් කුඩා පාලමක් ඉදිකිරීම.</u>

සබරගමුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂය තුලදී රු. 1,650,000 ක වටිනාකමින් යුත් ගිවිසුමකට එළඹ තිබූ මෙම කර්මාන්තය පිළිබඳව 2015 ජූනි 23 වන දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පාලමේ කොන්ක්‍රීට් කණු පමණක් ඉදිකර වැඩ අතරමඟ නවතා දමා ඇති අතර, පාලම මතින් ගමන් කිරීමට අවැසි කොන්ක්‍රීට් තට්ටුව ඉදිකර නොමැති බැවින් දැනට ඉදිකර ඇති කොටසින්ද කිසිඳු ප්‍රයෝජනයක් අත්වී නොතිබුණි.

(ii) පාලමට ප්‍රවේශ වන මාර්ගය දෙපස ආසන්නයටම ගොඩනැඟිලි 02 ක් ඉදිකර ඇති බැවින් ප්‍රවේශ මාර්ගය මීටර් 2.5 ක් පමණට පටුවී තිබුණි. එක් ගොඩනැගිල්ලක කොන්ක්‍රීට් තට්ටුවේ අඟුව හා අනෙක් පස ගොඩනැගිල්ලේ අඟුව මාර්ග දෙසට නෙරා එන ලෙස ඉදිකර ඇති බැවින් ප්‍රවේශ මාර්ගයේ උපයෝජනය තවදුරටත් සීමා වී තිබුණි.

3.6 සන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කසල කළමනාකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2015 ජූනි 23 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දෛනිකව එකතුවන කසල, ඉදිකර ඇති ශාලා දෙකෙහිම ගොඩ ගසා ඇති බැවින් එම කසල ගොඩවල් වලින් ශාලා දැනටමත් ඇහිරී ගොස් ඇත. මේ හේතුවෙන් ඉදිරියේදී එකතුවන කසල තේරීම හා ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට ලක්කිරීමට අවැසි ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීය.

(ii) අපද්‍රව්‍ය මිශ්‍ර ජලය (ලීචේට්) රැස් කරන ටැංකි ප්‍රමාණවත් නොවන බවත්, එහි ජලය පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය නිවැරදිව සිදු නොවන බවත්, නිරීක්ෂණය විය. ඒ හේතුවෙන්ම එකතු වන ජලය මෝටර් මඟින් නැවත අවට පරිසරයට අනාරක්ෂිතව මුදාහැරීම තුල වෙනත් පරිසර දූෂණයකට මඟ පාදා තිබුණි.

(iii) අපද්‍රව්‍ය නිසා ඇතිවන පණුවන් අවට පරිසරයේ බහුලව දැකිය හැකි අතර, එම සතුන් මර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවිය.

(iv) ව්‍යාපෘතියේ සේවයේ නියුතු සේවකයින්ද කසල වෙන්කිරීම දැනට අතින් සිදු කරන අතර, එය අනාරක්ෂිතව සිදුවීම තුල සෞඛ්‍යාරක්ෂිත ගැටළු ඇතිවීමේ අවදානමක් පැවතුණි.

(v) එකතු වන ප්ලාස්ටික් හා පොලිතීන් ද්‍රව්‍ය භූමියේ ගොඩගසා තිබෙන අතර, ඒවා අලෙවිය පිළිබඳ විධිමත් ලේඛණගත කිරීමක් සිදුකර නොතිබුණි.

(vi) අතිශය සංවේදී පාරිසරික ගැටළුවකට පිලියමක් ලෙස ආරම්භ කරන ලද මෙම කසල ව්‍යාපෘතියට අදාලව ප්‍රමාණවත් පහසුකම් තවමත් ගොඩනැඟී නොතිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) සන අපද්‍රව්‍ය කළමනාකරණය